•

# හොරිවිල පාරම්පරික කැඩුම් බිඳුම් වෙදකම හා හොරිවිල පාරම්පරික වෛද්‍යවරයා

වෛද්‍ය එරංග කරාඳුගොඩ, පාරම්පරික වෛද්‍ය එස්.එම්.එච්.විජේසිංහ

ධාතුසේන රජ සමය දක්වා ඈතට විහිදී යන හොරිවිල කැඩුම් බිඳුම් වෙදකමෙහි ස්වර්ණමය යුගය ඇරඹෙන්නේ එහි තිස් වන පුරුක වන සේනානායක මුදියන්සේලාගේ කවුරාල වෙදමහතාගේ හේරත්හාමි වෙදැදුරාණන්ගේ සමයේ සිටය. ඈත රජ දවස සිට ශල්‍ය ප්‍රතිකාර සඳහා උපන් හපන්කම් දැක්වූ මෙම විශිෂ්ට වෙද පරපුරෙහි ලිඛිත සාක්ෂි හමුවන්නේ එහි 26වන පුරුක වන සේනානායක මුදියන්සේලාගේ සිලම්බුරාල වෙදැදුරාණන්ගේ සිට ය. සේනානායක මුදියන්සේලාගේ සිලම්බුරාල, අප්පුරාල, කවුරාල, කුඩාරාල, සේනානායක මුදියන්සේලාගේ කවුරාල වෙදමහතාගේ හේරත්හාමි කපුරාල ආදී පූර්වාචාරීන් මෑත ඉතිහාසයේ මෙම පරපුර පෝෂණය කළා වූ වෙදදුරෝ වෙති.

වෙදකමට ඍෂිවරයෙක් බඳු වූ සේනානායක මුදියන්සේලාගේ කපුරාල වෙද මහතාගේ හේරත්හාමි වෙදැදුරාණන් දැයට බිහි කළ වෙද පුතුන් හතර දෙනෙකි. සේනානායක මුදියන්සේලාගේ හේරත්හාමි සේනබණ්ඩා, සේනානායක මුදියන්සේලාගේ හේරත්හාමි සේනානායක, සේනානායක මුදියන්සේලාගේ හේරත්හාමි විජේසිංහ යන වෙදදුරාණන් ලක්දිව සුපතල ව රෝගීන් සුවපත් කිරීමෙහිලා මේ වන විටත් නිරත වෙමින් සිටිති.

භග්නයක් සිදු වූ අවස්ථාවක ප්‍රතිකාර කිරීමේ දී ප්‍රධාන අවස්ථා 03ක් ඔස්සේ ප්‍රතිකාර කළ යුතුය. රෝගියාට ප්‍රථමාධාර යෙදීමත් හදිසි ප්‍රතිකාර මඟින් සංකූලතා මඟ හැරවීමත් භග්නයට ප්‍රතිකාර කිරීමත් එම ප්‍රධාන අවස්ථාවන්ය. ප්‍රථමාධාර කටයුතු අනතුර සිදු වූ ස්ථානයේ දී ම සිදු කළ යුතු අතර රෝගියා ගේ ජීවය ආරක්‍ෂා කර ගැනීමත් සංකූලතා ඇතිවීම වැළැක්වීමත් භග්නය පැතිරීම වැළැක්වීමත් ප්‍රථමාධාර යෙදීමේ ප්‍රධාන අරමුණු වේ. හදිසි ප්‍රතිකාර ලෙස රෝගියාගේ හෘද ස්පන්දනය ක්‍රමවත් කිරීම, ශ්වසන අපහසුතා වැළැක්වීම, රුධිර වහනය වැළැක්වීම, අභ්‍යන්තරයේ සංචිත රුධිරය ඉවත් කිරීම, ඇති වූ තුවාල සඳහා ප්‍රතිකාර යෙදීම දැක්විය හැකිය. ඉන් අනතුරු ව භග්නයට ප්‍රතිකාර කිරීම සිදු කරයි. ප්‍රථමාධාර හා හදිසි ප්‍රතිකාර වලින් රෝගියාගේ ප්‍රධාන සංකූලතා මඟ හැරවීමෙන් පසු මෙම කාර්යය ආරම්භ වෙයි. මෙහිදී භග්නය නිවැරදි ව සැකසීමත් සකසන ලද භග්නයට ඖෂධ තැබීමත් එය ස්ථාවර කිරීම සඳහා පතුරු හා බන්ධන යොදා බැඳීමත් සිදු කරයි. ඖෂධ ලෙස තෙල් වර්ග, මැල්ලුම් වර්ග, තැවිලි වර්ග, පත්තු මෙන්ම තෙල්කිර ද අවස්ථානුකූල ව භාවිතා කරයි. චන්ද්‍ර ගණයේ ඖෂධ හා සූර්ය ගණයේ ඖෂධ මැනවින් වෙන්කර හඳුනා ගෙන අස්ථි සන්ධි කිරීම හා අනෙකුත් පටක ක්‍රමවත් කිරීම සඳහා අවස්ථානෝචිත ව භාවිත කෙරේ. කැඩුම් බිඳුම් ප්‍රතිකාරය අතරතුර දී රෝගියාට ඇතිවිය හැකි ව්‍රණ ශෝථය, ඖෂධ අසාත්මිකතා, මළබද්ධය, මුත්‍රා ආසාදන, ව්‍රණ ආසාදන, විකෘති සන්ධිවීම්, අස්ථි ආශ්‍රිත ජානමය දුර්වලතා, පෝෂණ දුර්වලතා හේතුවෙන් සන්ධි වීම ප්‍රමාද වීම ආදී සංකූලතා මැනවින් හඳුනා ගැනීමේ හැකියාවක් මෙම වෛද්‍ය ක්‍රමය සතුව පවතින අතර එම තත්ත්වයන් සමනය කිරීම සඳහා සාර්ථක ප්‍රතිකාර පද්ධතියකින් ද හොරිවිල වෙද පරපුර පොහොසත්ය.

භග්නයක දී හෝ අවසන් සන්ධි වීමක දී අදාළ ප්‍රතිකාර පමණක් නොව ඉතා දියුණු විද්‍යාත්මක ක්‍රම වේදයකට අනුව බිඳුණු අස්ථි ස්ථාවර කිරීම සඳහා පතුරු හා ආධාරක තබා බන්ධන යෙදීමත් ඒ සඳහා අනුගමනය කරනු ලබන සුවිශේෂී උපක්‍රම ද මෙම වෛද්‍ය ක්‍රමය සතුව පවතී. භග්න චිකිත්සාවේ දී ස්පර්ශ පරීක්‍ෂාව, ප්‍රශ්න පරීක්‍ෂාව, දර්ශන පරීක්‍ෂාව ආදී ක්‍රම භාවිතා කරමින් රෝගයේ තත්ත්වය මැනවින් අවබෝධ කර ගන්නා අතර ම නවීන ඉගැන්වීම් ක්‍රම හා විද්‍යාත්මක ඥානයත් තම වෛද්‍ය ක්‍රමය සමඟ මුසු කර ගනිමින් ශක්තිමත් පදනමක් ඔස්සේ තම ප්‍රතිකාර විධි අනුගමනය කිරීම හොරිවිල වෙද පරපුරෙහි දක්නට ලැබෙන විශේෂ ලක්‍ෂණයකි. විශේෂ අවස්ථා වල දී තෙල් ගා මන්ත්‍ර වලින් මැතිරීමත් රෝගීන්ගේ අපල උපද්‍රව දුරු කිරීමට පිරිත් කීම, බෝධි පූජා පැවැත්වීම ආදී ක්‍රමෝපායන් භාවිත කිරීම ද විශේෂයෙන් දක්නට ලැබේ. ඖෂධ නිෂ්පාදනයේ දී ද ඖෂධ සංයෝග

කිරීමේ දී ද රෝගී විෂයෙහි ඖෂධ උපයෝග කිරීමේ දී ද බෞද්ධ වත් පිළිවෙත් අනුව කටයුතු කිරීමත් දිනපතා බුදුන්, දෙවියන්, ගුරුවරුන්, දෙගුරුන්, පූර්වාචාරීන් නැමදීමත් සිදුකරනු දක්නට හැකිය. හොරිවිල පරපුරේ භග්න ප්‍රතිකාරය සඳහා තෙල් වර්ග භාවිත කිරීමේ දී ඖෂධ විශාල සංඛ්‍යාවක සංයෝජනයෙන් සාදා ගනු ලබන හොරිවිල පරම්පරාවට ආවේණික කැඩුම් බිඳුම් තෛලයට අමතර ව තල තෙල්, මී තෙල්, පිණ්ඩ තෙල්, මහානාරායණ තෙල් හා මහානීල්‍යාදි තෛලය ද බහුල ව භාවිත කිරීම සිදු වේ.

තැවීමට පෙර තල තෙල් අභ්‍යංග කිරීමත් තැවීමෙන් පසු ඖෂධීය තෙල් ආලේපයත් විශේෂයෙන් දක්නට ලැබෙන අතර මැල්ලුම් හෝ පත්තු යෙදීමට පෙර එම මැල්ලුමට හෝ පත්තුවට නියමිත තැවිල්ලකින් තැවීම සිදුකරයි. මෙම කැඩුම් බිඳුම් ප්‍රතිකාර ක්‍රමයේ සුලබ ව භාවිත වන මැල්ලුම් වර්ග කීපයක් ලෙස සූරිය මැල්ලුම, කිරිවැල්-කොබ්බෑ කොළ මැල්ලුම, අංකෙන්ද කොළ මැල්ලුම, පුපුල කොළ මැල්ලුම , මී කොළ පොතු මැල්ලුම , කිරිවැල්-කැලිය මැල්ලුම ආදිය දැක්විය හැකිය.

මෙම සියලුම මැල්ලුම් වර්ග සඳහා තල තෙල්, අමුකහ, පොල් ආදිය පොදුවේ භාවිත කරනු ලබන අතර බැලතණ, හාතවාරිය, කැටකෑල, ගංසූරිය, කොබ්බෑ, කිරිවැල්, අංකෙන්ද, මී, පුපුල ආදී ශාක ඖෂධ බහුල ව භාවිත කරයි. මෙම වෛද්‍ය ක්‍රමයෙහි පත්තු වශයෙන් නික පත්තුව, උඳු පත්තුව, නවහන්දි පත්තුව, කැටකෑල පත්තුව,  මහ පත්තුව ආදී පත්තු සුලබ ව යොදා ගන්නා අතර මීපැණි, කැකුළු හාල් පිටි, කුරක්කන් පිටි පත්තු සඳහා පොදුවේ භාවිත කරනු ලබන අතර සීල් අරක්කු, බෝමි පොතු යුෂ, ගෙරි පස්, වියන් දුඹුළු, අරළු, බුළු, නෙල්ලි, පුස් ඇටමද, කළුදුරු, සුදුරු, අසමෝදගම් ආදී ඖෂධ වර්ග පත්තු සැකසීමේදී සුලබ ව භාවිත කරයි. මෙම පත්තු යෙදීමේ දී ඊට සරිලන ක්‍රමවේදයක් දක්නට ලැබෙන අතර ආසන්නයේ යෙදෙන පත්තුවල වෙනස්කම් පවතිනුයේ සුළු වශයෙනි. විශේෂ පත්තුව සැකසීම සඳහා යොදා ගනු ලබන කෂායෙහි ප්‍රධාන වශයෙන් වෙනස්කම් දක්නට ලැබේ.

භග්න සැකසීම, ඖෂධ ප්‍රතිකාර හා බන්ධන යෙදීමට අමතර ව රෝගියා අනුගමනය කළයුතු විශේෂ ආහාර විහරණ පද්ධතියකින් ද මෙම වෛද්‍ය ක්‍රමය පොහොසත් වේ. වෛද්‍යවරයා තුළ පවතින කරුණාව, දයාව, භග්නය සැකසීම සඳහා ඔහු දක්වනු ලබන දක්ෂතාව ය, එම අදාළ ස්ථානයට ගැලපෙන අයුරින් බන්ධන යෙදීමට ඇති දක්ෂතාව ය, පතුරු සකස් කර ගනිමින් එම ස්ථානයට අනුව ගැලපෙන ආකාරයට පතුරු යෙදීමට ඇති දක්ෂතාවය හා රෝගියා ප්‍රවේශම් වියයුතු ආකාරය ලබා ගතයුතු ආහාර වර්ග පිළිබඳ ව රෝගියා දැනුවත් කිරීමේ දක්ෂථාවය ආදී සියලුම කරුණු සම්බන්ධයෙන් හොරිවිල වෛද්‍යවරයා නිපුණයෙකු වන අතර අත්දැකීම් හා පළපුරුද්දෙන් පිරිපුන් කාරුණික අයෙකු ද වේ.